ගම්පහ අධ්‍යාපන කලාපය

ප්‍රභාෂ්වර - 2024

5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව අභියෝගයට අත්වැලක්

5 ශ්‍රේණිය

I පත්‍රය

කාලය **ඃ- පැය 01 යි.**

නම **ඃ-** .....


පාසල **ඃ-** .....


විශේෂ අවධානය ට.....


සිසුන්ට උපදෙස්	විදුහල්පති හා ගුරු භවතුන්ට උපදෙස්
✸ මෙම ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් හොඳින් කියවන්න.	✸ පස්වන ශ්‍රේණියේ සිසු දරුවන්ගේ නිපුණතා මට්ටම් වර්ධනය කරලීම ඉලක්ක කොට මෙම විශේෂ අනාවරණ පෙරහුරු ප්‍රශ්නපත්‍ර සකසන ලදී.
✸ සියලුම ප්‍රශ්න සඳහා දී ඇති උපදෙස් අනුව මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.	✸ මෙම ප්‍රශ්න පත්‍ර සකසන ලද්දේ ගම්පහ අධ්‍යාපන කලාපයේ සේවය කරන ප්‍රවීණ ගුරු භවතුන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් විසිනි.
✸ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.	✸ පිළිතුරු පත් ලකුණු කිරීමේ දී අප ලබාදෙන පිළිතුරු පත්‍රය අදාළ කරගත හැකිය.
✸ අවශ්‍ය නම් කටු වැඩ කොළයක් භාවිත කරන්න.	✸ ප්‍රශ්න පත්‍රය ලබා දී සතියක් තුළ අදාළ ආකෘතියට අනුව ලකුණු විශ්ලේෂණ කලාප අධ්‍යාපන කාර්යාලයට ලබා දිය යුතුය.
✸ පිළිතුරු සපයා අවසන් වූ පසුව කාලය ඉතිරිව ඇත් නම් නැවතත් ඔබගේ පිළිතුරු පරීක්ෂා කරන්න.	✸ ලකුණු විශ්ලේෂණ අනුව දරුවන් සඳහා ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණ වැඩසටහන් දියත් කළ යුතුය.
	✸ ඉතාමත් සතුටින් හා සැහැල්ලුවෙන් දරුවන් සඳහා පිළිතුරු සැපයීමේ අවස්ථාව විධිමත්ව සැලසුම්කොට ලබාදීම ඔබ සතු වගකීමකි.
	✸ මේ සඳහා ඔබ දක්වන උනන්දුව, කැපවීම හා සහයෝගය අපි අගය කරමු.

ගම්පහ අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අංශය


01. පහත රූප තුන අතුරින් එක රූපයක වෙනසක් ඇත. එම රූපය තෝරන්න.

1. 

2. 


3. 

02. එකම කාණ්ඩයකට ඇතුළත් කිරීමට වඩාත් ම සුදුසු ද්‍රව්‍ය දෙක මොනවා ද?




1. ඇඳ සහ පොත 2. පොත සහ පැන්සල 3. බෝතලය සහ කුඩය


03. පහත රූපවලින් දැක්වෙන මල් ඒවා අතර ඇති හොඳම සම්බන්ධතාව මත කාණ්ඩ දෙකකට වෙන් කළ හැකි ආකාරය කුමක් ද?




1. AB සහ CD ලෙස 2. BC සහ AD ලෙස 3. AC සහ BD ලෙස

04. පහත රූපවලින් දැක්වෙන සත්ත්ව වර්ග දෙකකට පමණක් අදාළ වන ප්‍රකාශය කුමක් ද?









1. සත්වයා ආහාර ගනියි 2. තුරුමත ජීවත් වේ 3. කිරි බී වැඩෙයි.

05. කොටුව තුළ ඇති රූපය සකස් කර ගැනීම සඳහා ඒ අයුරින් ම යොදා ගත යුතු රූප දෙක මොනවා ද?






A B C D

1. A සහ B 2. B සහ C 3. C සහ D


06. පහත දැක්වෙන්නේ 50g , 100g සහ 200g බර සඳහන් වූ තරාදි පඩි කට්ටල තුනකි.






එක් ගොඩකින් එක් පඩියක් ද , තව ගොඩකින් පඩි දෙකක් ද, අනෙක් ගොඩෙන් පඩි තුනක් ද ගෙන සැකසිය හැකි වැඩිම බර ප්‍රමාණය කොපමණ ද?

1. 550g 2. 850g 3. 800g


07. පහත දැක්වෙන්නේ හැඩතල තුනකි.



එම හැඩතල යොදා ගනිමින් සකසා ඇති රූපය කුමක් ද?

1. 
2. 
3. 

08. රූපයේ දක්වා ඇත්තේ එකම ප්‍රමාණයේ මිනුම් සරා තුනක ඇති පොල්තෙල්, භූමිතෙල් සහ ඩීසල් ප්‍රමාණ මනින ලද අවස්ථා තුනකි.




පොල් තෙල් **භූමි තෙල්** **ඩීසල්**

එම දියර ප්‍රමාණ පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

1. පොල්තෙල් ප්‍රමාණය භූමිතෙල් ප්‍රමාණය මෙන් දෙගුණයකි.
2. ඩීසල් ප්‍රමාණය භූමිතෙල් ප්‍රමාණය මෙන් තුන් ගුණයකි.
3. පොල් තෙල් ප්‍රමාණය ඩීසල් ප්‍රමාණය මෙන් දෙගුණයකි.

09. තිත් සටහන් සහිත ලී කුට්ටි පහක් පහත රූපයේ දැක් වේ.



තිත් සටහන් දැක්වෙන අගය ආරෝහණ පිළිවෙළට සකස් කිරීමට අවම වශයෙන් ලී කුට්ටි කීයක පිහිටීම වෙනස් කළ යුතු ද?

1. එකකි 2. තුනකි 3. දෙකකි

ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රාථමික අංශය

10. වැස්සක් ආ විට මා සැනසෙයි - වැස්සෙන් පසු යළි එළිය ගෙනෙයි
ජල බිඳු අතරින් පාට මැවෙයි - හිරු එළියෙන් මා උපත ලබයි

මෙම කවියේ අදහසට වඩාත් හොඳින් ගැළපිය හැක්කේ,

1. අකුණු සැර 2. දේදුන්න 3. වලාකුළු

11. පහත දැක්වෙන ඡේදයේ හිස්තැනට ගැළපෙන වචන ඇතුළත් කොටස කුමක් ද?

සයුර යනු සම්පතකි. සිව් දෙසින් ඉන්දියන් සාගරයෙන් [ ] ශ්‍රී ලංකාව සාගර සම්පතින් අනූන රටකි. නමුත් [ ] එහි උපරිම ඵල නෙළා ගන්නා රටක් නොවේ. [ ] වන විට ටින් මාළු හා කරවල පිට රටින් ආනයනය කිරීමට සිදුව ඇත්තේ ඒ නිසයි.

1. වට වූ / අපේ රට / වර්තමානය
2. සීමා වූ / සාගරය / අතීතය
3. මායිම් වූ / ඉන්දියාව / වර්තමානය

12. අනතුරු වළක්වා ගෙන විපත්වලින් සිදුවන හානි අවම කර ගනිමින් ජීවත් විය හැකි පරිසරයක් ගොඩනැගීම අපට අත්හළ නොහැකි වගකීමකි. ඒවාගේම වර්තමානයේ දී අසන්නට දකින්නට ලැබෙන අනතුරු විපත් සහ වසංගත රෝග හැකි උපරිම මට්ටමින් වළක්වා ගැනීමට අප කටයුතු කළ යුතුය.


ඉහත ප්‍රකාශයේ සමස්ත අදහස වන්නේ,

1. අනතුරු වළක්වා ගැනීම පිළිබඳ
2. ආරක්ෂාව හා පරිස්සම පිළිබඳ වැදගත්කම
3. විපත් වලින් වැළකීම පිළිබඳ


13. දින දර්ශනයක බදාදාවකින් ආරම්භ වන එක්තරා මාසයක සිකුරාදා දවසෙහි අගයන් ඇතුළත් සිරස් තීරය වැසී යන සේ කොළයක් අලවා ඇත. එම දවස් වල එකතුවට තැබිය හැකි උපරිම අගය වන්නේ,


1. 75 2. 80 3. 85


14. නගරයක පොලීසිය, රෝහල, පාසල පිහිටා තිබුණේ පහත පරිදි ය.



පොලීසියේ සිට ඉදිරියට එන අයෙකුට තොරතුරු දැක්වෙන නිවැරදි පුවරුව කුමක් ද?


1. 

2. 

3. 

ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රාථමික අංශය

15. රටාව අනුව ? ලකුණට ගැළපෙන සංඛ්‍යාව කීය ද?




1. 12 2. 25 3. 39

16. යතුරු පැදි ධාවන තරඟයක් නිමවීමට පෙර සිව්වන ස්ථානයේ සිටි සමන් තෙවන ස්ථානයේ සිටි තිසක් ව පසු කළේ ය. පළමු ස්ථානයේ සිටි දසුන්ගේ යතුරුපැදිය අනතුරකට ලක්වීමෙන් තරඟයෙන් ඉවත් වූයේ , නම් පහත ප්‍රකාශ අතරින් සත්‍ය විය හැකි ප්‍රකාශය තෝරන්න.

1. තිසක් තුන්වන ස්ථානය ලැබූ අතර සමන් දෙවන ස්ථානය ලබා ගත්තේ ය.
2. සමන් තුන්වන ස්ථානය ලබා ගන්නා විට තිසක් හතරවන ස්ථානය ලබා ගත්තේ ය.
3. දසුන් පළමු ස්ථානය ලබා ගත් අතර සමන් තුන්වන ස්ථානය ලබා ගත්තේ ය.

17.



ඉහත කොටස් සියල්ල යොදා ගෙන සැකසිය හැකි හැඩතලය වන්නේ,

1. සමචතුරස්‍රය 2. ත්‍රිකෝණය 3. සෘජුකෝණාස්‍රය

18. සීතා ගැහැනු ළමයෙකි. ඇයට සිටින සහෝදරියන් ගණන සහෝදරයන් ගණන මෙන් දෙගුණයකි. ඒ අනුව සීතාගේ පවුලේ සිටින ගැහැනු දරුවන් ගණන පිරිමි දරුවන් මෙන්,

1. දෙගුණයට වඩා එකක් වැඩි ය.
2. දෙගුණයකි.
3. දෙගුණයට වඩා එකක් අඩුය.


19. පන්තියක සිටින සුදත්, නිසාර්, රාමන් , දුනෙත් යන හතර දෙනා අතරින් රාමන් තිදෙනෙකුට වඩා වැඩි ලකුණු ලබා ගත්තේ ය. නිසාර් තිදෙනෙකුට වඩා අඩු ලකුණු ලබා ගත්තේ ය. දෙදෙනෙක් දුනෙත්ට වඩා වැඩි ලකුණු ලබා ගත්තේ ය. ලබා ගත් ලකුණු ප්‍රමාණය වැඩිවෙන අනුපිළිවෙළ සහිත පිළිතුර කුමක් ද?

1. රාමන් , දුනෙත් , සුදත් , නිසාර්
2. රාමන් , සුදත් , දුනෙත් , නිසාර්
3. නිසාර් , දුනෙත් , සුදත් , රාමන්

20. කණ්ඩායමක සිටින ගැහැනු ළමයි අත රතු පෑන් 3 බැගින් ද, පිරිමි ළමයින් අත නිල් පෑන් 2 බැගින් ද ඇත. සියලු දෙනා ළඟම ඇති මුළු පෑන් ගණන 31 ක් නම් කණ්ඩායමේ සිටින මුළු පිරිස කොපමණ ද?

1. 15 2. 12 3. 10

21. රටාව අනුව හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?



1. 4 2. 3 3. 8

ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය ප්‍රාථමික අංශය

22. සඳමාලි සවස පන්ති නිම වී නිවසට පැමිණෙන විට ඇගේ සෙවණැල්ල ඇයට ඉදිරියෙන් වැටී තිබුණි. ඇය ගමන් කළ දිශාවට විරුද්ධ දිශාව කුමක් ද?

1. උතුර 2. බස්නාහිර 3. නැගෙනහිර

23. රූපයේ දැක්වෙන ජාලයෙහි පළමු තීරුවත් තුන්වන තීරුවත් එකිනෙකට මාරු කළ විට ලැබෙන ජාලයෙහි පළමුවන පේළියත් තුන්වන පේළියත් එකිනෙකට මාරු කරනු ලැබේ. එසේ කිරීමේ දී එක් වරක්වත් වෙනස් නොවූ සංකේතය කුමක් ද?


i	ii	iii
vi	v	iv
vii	viii	ix

1. vi 2. v 3. iv

24. හරි මැදින් ඇමුණුම් කටු යොදා සාදා ඇති පිටු 40 ක අභ්‍යාස පොතක 11 සහ 12 පිටු අයත් කොළය මුළුම නින් ම ඉරා ඉවත් කර ගත් විට ඒ සමඟ පොතෙන් ගැලවී යා හැකි අනෙක් කොළයට අයත් වන පිටු දෙක මොනවා ද?


1. 25 සහ 26 2. 27 සහ 28 3. 29 සහ 30

25. පහත රූපයේ ඇති වැඩි ම ත්‍රිකෝණ ගණන හා කපාගත හැකි ත්‍රිකෝණ ගණන පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.





1. 16 , 6
2. 21 , 6
3. 6 , 16


26.




ඉහත කොටුව තුළ ඇති රූප පේළියේ ඊළඟට යෙදිය යුතු රූපය කුමක් ද?

1. 
2. 
3. 


27. පහත A , B සහ C රූප තුන බලන්න.



A රූපය



B රූපය



C රූපය


එම රූප තුනෙහි පවතින කිසියම් පොදු ලක්ෂණයක් අනුව ඉන් රූප යුගල කළ හැකි ය. එම යුගලය වන්නේ,

1. A සහ B ය 2. A සහ C ය 3. B සහ C ය

ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රාථමික අංශය

28. මහනුවර, යාපනය , සීගිරිය , අනුරාධපුරය සහ ගාල්ල යන ස්ථාන අතරින් දසුන් ස්ථාන දෙකකට ගොස් නැත. මිහිරි පමණක් මහනුවරට ගොස් ඇත. මිහිරි මෙන්ම දසුන් ද යාපනය හා සීගිරිය යන ස්ථාන දෙකට ගොස් ඇත. මේ අනුව දසුන් නිශ්චිතව ම,

1. අනුරාධපුරය සහ ගාල්ල යන ස්ථාන දෙකෙන් එකකට ගොස් නැත.
2. මහනුවර සහ අනුරාධපුරය යන ස්ථාන දෙකට ගොස් ඇත.
3. මහනුවර සහ ගාල්ල යන ස්ථාන දෙකට ගොස් නැත.

29. 

රූපයේ දැක්වෙන ගණක රාමුවේ සියයස්ථානය දැක්වෙන කුරේ ගණක 4 ක් දමා ඇත්තේ පහළ සිට ඉහළට පිළිවෙළින් නිල් ගණක 1 ක් , කොළ ගණක 1 ක් හා රතු ගණක 2 ක් වශයෙනි. එම ගණක ඇසුරින් 211 සංඛ්‍යාව නිරූපණය කළ යුත්තේ පහත කොන්දේසි අනුව ය.

- සියයස්ථානයේ රතු ගණක ද , දහයස්ථානයේ නිල් ගණක ද , එකස්ථානයේ කොළ ගණක ද දැමිය යුතු ය.
- වරකට ඉවත් කළ හැක්කේ එක් ගණකයක් පමණි.
- සෑම විටම ඉවත් කළ යුත්තේ ඉහළින් ම පිහිටන ගණකයයි.
- ඉවත් කරනු ලබන ගණකය අතෙහි තබා නොගෙන කුරකට දැමිය යුතු ය.


මේ අනුව සංඛ්‍යාව නිවැරදි ව නිරූපණය කිරීම සඳහා කළ යුතු අවම මාරු කිරීම් ගණන කීයද?




1. 9 2. 8 3. 7

30. විකුම්ට සුභාෂිතයේ එක් කවියක් පාඩම් කිරීමට මිනිත්තු 20 ක් ද පැතුම්ට මිනිත්තු 15 ක් ද ගතවෙයි. ඔවුන් දෙදෙනාම කවි පාඩම් කිරීම පෙරවරු 7.30 ට ආරම්භ කළේ නම් දෙදෙනාට ම කවි 7 ක් පාඩම් කිරීමට ගතවන කාලය කොපමණ ද?

1. මිනිත්තු 140 2. මිනිත්තු 240 3. මිනිත්තු 60

31. රටාව අනුව ? ලකුණට ගැළපෙන රූපය කුමක් ද?



1. 
2. 
3. 

32. දුම්රිය ස්ථානයක සංඥා පුවරුවක ඇති බල්බ පිළිවෙළින් එකක් දැල් වී නිවී ගිය විගස අනෙක දැල්වෙයි. එලෙස එක ළඟ ඇති බල්බ තුනක් දැල්වීමට ගත වන අඩු ම කාලය තත්පර 4 කි. එහි ළඟ ඇති බල්බ 8 ක් දැල්වීමට ගතවන අඩු ම කාලය කොපමණ ද?

1. තත්පර 16 2. තත්පර 14 3. තත්පර 12

33. A කණ්ඩායමේ ළමයි අට දෙනෙක් ද B කණ්ඩායමේ ළමයි හතර දෙනෙක් ද සිටිති. B කණ්ඩායමේ සිටි ළමයින්ගෙන් ½ ක් A කණ්ඩායමට ගිය අතර ඉන් පසු A කණ්ඩායමේ දැන් සිටින ළමයින්ගෙන් ½ ක් B කණ්ඩායමට ගිය පසු A කණ්ඩායමේ සිටීමට අකමැති වූ කසුන් B කණ්ඩායමට එකතු විය. ඒ අනුව සත්‍ය විය නොහැකි ප්‍රකාශය තෝරන්න.

1. B කණ්ඩායමේ සිටින ළමයි ගණන A කණ්ඩායමේ සිටින ළමයි ගණන මෙන් දෙගුණයකි.
2. A කණ්ඩායමේ සිටින ළමයි ගණන B කණ්ඩායමේ ළමයි ගණනින් අර්ධයකි.
3. A කණ්ඩායමේ සිටින ළමයි ගණන B කණ්ඩායමේ සිටින ළමයි ගණන මෙන් දෙගුණයකි.

ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය ප්‍රාථමික අංශය

34. එක්තරා ක්‍රීඩා තරගයක් අවසානයෙහි එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ජයග්‍රාහී කණ්ඩායමේ සාමාජිකයින් සියලු දෙනාට ම අතට අත දුන් අතර සාමාජිකයෝ සියලු දෙනා ද එකිනෙකාට අතට අත දී සතුට ප්‍රකාශ කළහ. ඔවුන් අතට අත දුන් මුළු වාර ගණන 21 ක් නම් ක්‍රීඩා කණ්ඩායමට අයත් වූ සාමාජිකයින් ගණන කොපමණ ද?

1. 6 2. 7 3. 8


35. වෙළෙන්දෙක් තැඹිලි ගෙඩි 3 ක් රුපියල් 40 බැගින් මිල දී ගෙන, තැඹිලි ගෙඩි 2 ක් රුපියල් 40 බැගින් විකුණුවේ ය. දිනක තැඹිලි විකිණීමෙන් ඔහු රුපියල් 400 ක් ලාභ ලැබුවේ ය. එදින ඔහු විකුණු තැඹිලි ගෙඩි ගණන කීය ද?

1. 20 2. 40 3. 60

36. 2023 වර්ෂය සඳහා එක්තරා දින දර්ශනයක් සකසා ඇත්තේ එක් එක් මාසයට එක් පිටුවක් බැගින් වන සේ ය. එම සෑම පිටුවක ම ඊට අයත් මාසයට අමතරව ඊට පෙර මාසය හා පසු මාසය ද කුඩාවට මුද්‍රණය කර ඇත. මෙම දින දර්ශනයේ පිටු 12 අතරින් 2023 වර්ෂයට අයත් නොව මාස කීයක් මුද්‍රණය කර තිබේ ද?

1. 2 2. 10 3. 14

37. රූපයේ දැකිය හැකි චතුරස්‍ර ගණන වන්නේ,



1. තුනකි
2. හතකි
3. දහයකි

38. කුඩා ඝනක එකතු කර විශාල ඝනකයක් සාදන බුවනෙක එහි පහළ ම තට්ටුව කුඩා ඝනක 9ක් තබා නිම කර තිබෙයි. ඔහු සතුව තවත් ඉතිරිව ඇත්තේ එවැනි කුඩා ඝනක 6 ක් නම් විශාල ඝනකය සම්පූර්ණ කිරීමට ඔහුට තවත් කුඩා ඝනක කීයක් අවශ්‍ය ද?

1. 12 2. 18 3. 27

39. එකිනෙකට බර ප්‍රමාණයෙන් වෙනස් යකඩ බෝල තුනක් පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක් වේ.

- A බෝලයේ බර සහ B බෝලයේ බරෙහි එකතුවට වඩා C බෝලයෙහි බර වැඩි ය.
- C බෝලයේ බර සහ B බෝලයේ බරෙහි එකතුවට වඩා C බෝලයෙහි බර සහ A බෝලයේ බරෙහි එකතුව වැඩි ය.

ඒ අනුවබර වැඩි බෝලයේ සිට බර අඩු ම බෝලයට අනුපිළිවෙළට පෙළ ගැස් වූ විට පිළිතුර වන්නේ,

1. BCA 2. CAB 3. BAC

40. එක්තරා නගර වීදියක රෝහල පසු කළ පසුව පාසල , බැංකුව හා දුම්රියපොළ හමු වේ. එකිනෙක ස්ථාන අතර දුර කිලෝමීටරවලින් පහත වගුවේ දක්වා ඇත.

		පාසල	දුම්රියපොළ
		4	
	බැංකුව	6	2
රෝහල	3	9	.....

මේ අනුව රෝහලේ සිට දුම්රියපළට ඇති දුර කිලෝමීටර කීය ද?

1. 11 2. 7 3. 5

ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රාථමික අංශය

ගම්පහ අධ්‍යාපන කලාපය

ප්‍රහාෂ්වර - 2024

5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව අභියෝගයට අත්වැලක්

5 ශ්‍රේණිය

II පත්‍රය

කාලය **ඃ- පැය 01 මිනිත්තු 15 යි.**

නම **ඃ-** .....

පාසල **ඃ-** .....

විශේෂ අවධානය ට.....

සිසුන්ට උපදෙස්	**විදුහල්පති හා ගුරු භවතුන්ට උපදෙස්**
✸ මෙම ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් හොඳින් කියවන්න.	✸ පස්වන ශ්‍රේණියේ සිසු දරුවන්ගේ නිපුණතා මට්ටම් වර්ධනය කරලීම ඉලක්ක කොට මෙම විශේෂ අනාවරණ පෙරහුරු ප්‍රශ්නපත්‍ර සකසන ලදී.
✸ සියලුම ප්‍රශ්න සඳහා දී ඇති උපදෙස් අනුව මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.	✸ මෙම ප්‍රශ්න පත්‍ර සකසන ලද්දේ ගම්පහ අධ්‍යාපන කලාපයේ සේවය කරන ප්‍රවීණ ගුරු භවතුන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් විසිනි.
✸ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.	✸ පිළිතුරු පත් ලකුණු කිරීමේ දී අප ලබාදෙන පිළිතුරු පත්‍රය අදාළ කරගත හැකිය.
✸ අවශ්‍ය නම් කටු වැඩ කොළයක් භාවිත කරන්න.	✸ ප්‍රශ්න පත්‍රය ලබා දී සතියක් තුළ අදාළ ආකෘතියට අනුව ලකුණු විශ්ලේෂණ කලාප අධ්‍යාපන කාර්යාලයට ලබා දිය යුතුය.
✸ පිළිතුරු සපයා අවසන් වූ පසුව කාලය ඉතිරිව ඇත් නම් නැවතත් ඔබගේ පිළිතුරු පරීක්ෂා කරන්න.	✸ ලකුණු විශ්ලේෂණ අනුව දරුවන් සඳහා ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණ වැඩසටහන් දියත් කළ යුතුය.
	✸ ඉතාමත් සතුටින් හා සැහැල්ලුවෙන් දරුවන් සඳහා පිළිතුරු සැපයීමේ අවස්ථාව විධිමත්ව සැලසුම්කොට ලබාදීම ඔබ සතු වගකීමකි.
	✸ මේ සඳහා ඔබ දක්වන උනන්දුව, කැපවීම හා සහයෝගය අපි අගය කරමු.

ගම්පහ අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අංශය

01. පහත දැක්වෙන ඡේදය කියවන්න.

තිරය විවෘත විය. මෙතෙක් සෝෂාකාරී ව තිබූ උත්සව ශාලාව මීයට පිම්බාක් මෙන් නිහඬ ය. හෙළයේ මහා ගාන්ධර්වයන් වූ අමරදේව ශූරීන්ගේ ගීතයක් පසුබිමින් ඇසෙන අතර කරළිය සරසමින් සුරලොවින් බට දෙවඟනන් බඳු රංගන ශිල්පිනියෝ අලංකාර අභිමානවත් පූජා නැටුමක් ඉදිරිපත් කළහ. ප්‍රේක්ෂකයින් අමන්දානන්දයට පත් කළ රංගනය නිම වනවාත් සමඟ ම කන් බිහිරි කරවන අත්පොළසන් නාදයක් පැතිර ගියේ ය. නිවේදක ශිෂ්‍යයා ඒ අවස්ථාව පිළිබඳ ප්‍රශංසාත්මක අදහස් දැක්වීමක් කළේ ය.

අනතුරු ව දේශාභිමානී ගීතයකට රංගනයක් ඉදිරිපත් කිරීමට නර්තන ශිල්පීන් මෙන් ම ශිල්පිනියන් ද විශාල පිරිසක් වේදිකාවට පිවිසියේ ගී පද තාලයට රංගනයෙහි යෙදෙමින් ය.

✷ ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

1. මෙහි විස්තර වන අවස්ථාව තෝරා යටින් ඉරක් අඳින්න.
   (1) ක්‍රීඩා උත්සවයකි. (2) විවිධ ප්‍රසංගයකි
2. මෙහි සඳහන් උපමාවක් තෝරා ලියන්න. .....
3. මෙය පාසලක සිදු කරන ලද කාර්යයක් බව හඳුනාගත හැකි වචනය කුමක්ද ?

   .....
4. කන් බිහිරි කරවන අත්පොළසන් නාදයක් පැතිර ගියේ ය. මෙම වැකියේ උක්තය තෝරා ලියන්න. .....
5. නර්තන ශිල්පීන් මෙන් ම ශිල්පිනියන් ද සහභාගී වුයේ කුමක් සඳහා ද?

   .....
6. පූජා නැටුමෙහි ස්වභාවය විස්තර කර ඇත්තේ කෙසේ ද?

   .....

02. පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

1. (1) කලගුණ (2) කළගුන (3) කළගුණ
2. (1) දැකුම්කලු (2) දැකුම්කළු (3) දැඛුම්කළු

03. පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

1. සීයා උදැසනින් ම අවදි වෙයි. ( )
2. වෛද්‍යවරු රෝගය පිළිබඳ නිගමනයකට ආවේ ය. ( )
3. රෑ අහස පුරා ම තරු දිලිසෙයි. ( )
4. ළමයි බුරන බල්ලෝ දැක භීතියට පත් වූහ. ( )
5. ඌ දිය බීමට ගඟට පැමිණෙයි. ( )

04. බහුවචන , වර්තමාන කාල ක්‍රියා පද යුගල තෝරා යටින් ඉරක් අඳින්න.

1. බලති , ගියෝ ය.
2. සොයති , සකස් කරති
3. නැටුහ , බැලුවෝ ය

05. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

පුරා ම / ක්‍රියාත්මක / රාජධානිය / සේවය / තැපැල් / විද්‍යුත් / (ඊ මේල්) / වෙයි

.....

06. **පහත සඳහන් වාක්‍ය වර්තමාන කාල ඒකවචනයට හරවා ලියන්න.**

ළමයි තෙල් හිඳීමට භාවිත කරන සෙක්කුව අසලට ගියහ.

.....

07. **'පරණ' යන්නට විරුද්ධාර්ථ පදය ලියන්න.** .....

08. **පහත සඳහන් ආප්තෝපදේශයෙන් ප්‍රකාශ වන අදහස ලියන්න.**

පනින්න පෙර සිතා බලනු.

.....

09. **ජයසිරි බාල්දිය රැගෙන වත්ත පුරා ඇවිද්දේ ය. තැනින් තැන තිබූ යෝගට් කෝප්ප හිස් බෝතල් පොලිතීන් කවර , ටින් බෙලෙක්ක ආදිය අහුලා බාල්දියට දමා ගත්තේ ය. ඔහු පසුපසින් බල්ලා ද ඇවිද ගියේ ය.**

ඉහත වගන්තියෙහි යටින් ඉරි ඇඳි පද ගැළපෙන පරිදි යොදා පහත වගුව සම්පූර්ණ කරන්න.

පුද්ගල නාම	සත්ත්ව නාම	ද්‍රව්‍ය නාම	ස්ථාන නාම

10. **පහත සඳහන් අවස්ථාවට සම්බන්ධ සිද්ධි ඇතුළත් කරමින් ඉදිරියට වැකි තුනක් ගොඩනගන්න.**

සෑම වාක්‍යයක් ම වචන හයකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.

බක් මාසය උදාවෙයි. එරබදු ගස් මුදුන් රක්ත වර්ණවලින් පිරෙයි. විටින් විට කොහා අවුරුදු එන බව පවසයි.

1. .....

.....

2. .....

.....

3. .....


.....

11. **පහත ඉංග්‍රීසි වචනවලට අදාළ සිංහල වචනය සිංහල අකුරෙන් ලියන්න.**

1. Cabbage - .....
2. handkerchief - .....

12. **පහත රූපවලට අදාළ ඉංග්‍රීසි වචන ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.**

1.  | | | | | | | | | |

2.  | | | | | | |

13. **පහත සිංහල වැකි ඉංග්‍රීසි බසට හරවා ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.**

1. මගේ අතේ තියෙන්නේ මොනවා ද? - .....

2. මට සහෝදරියෝ දෙදෙනෙකු සිටිනවා. - .....

ගම්පහ අධ්‍යාපන කලාපය- ප්‍රාථමික අංශය

14. **පහත දෙමළ වචනයට අදාළ සිංහල වචනය සිංහල අකුරෙන් ලියන්න.**

එණ්බදු - .....

15. **පහත සිංහල වැකිය දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.**

එන්න අපි සෙල්ලම් කරමු - .....

✷ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉරමත ලියන්න.**

16. **තිස් දහස් තුන්සිය තිහ** සංඛ්‍යාව ලියන්න. .....

17. සියයස්ථානයට 9 ද , දහයස්ථානයට 8 ද එකස්ථානයට 5 ද දසදහසස්ථානයට 4 ද දහසස්ථානයට 0 ද වන සංඛ්‍යාව ලියන්න. .....

18. ..... , 20459 , ...

ඉහත දී ඇති සංඛ්‍යාවේ පෙර හා පසු සංඛ්‍යා ලියන්න.


19. දී ඇති සංඛ්‍යා රටාවල හිස්තැන් පුරවන්න.

1. 3 , 5 , 8 , 13 , ... 2. 4 , 5 , 8 , 10 , 12 , ...

20. පැළ තවානක අඹ පැළ 2579 ක් ද ඊට වඩා 558 ක් වැඩියෙන් කොස් පැළ ද ඇත. තවානේ ඇති


1. කොස් පැළ ගණන කීය ද? .....
2. කොස් පැළ හා අඹ පැළවල එකතුව කීය ද? .....

21. වත්තකින් ජූලි හා අගෝස්තු මාසවල දී කඩන ලද පොල් ගෙඩි ප්‍රමාණය පිළිවෙළින් 5387 සහ 6578 වේ. මාස දෙකේ ම කඩන ලද පොල් ගෙඩි ගණන් සමාන වීමට ජූලි මාසයේ තව පොල් ගෙඩි කීයක් කැඩිය යුතුව තිබුණි ද?. .....

22.  මෙම ඝන වස්තු දෙකේ ශීර්ෂවල එකතුව කීය ද?

.....

23. තරිඳු සෙන්ටිමීටර කෝදුවක් යොදාගෙන රූපයේ දැක්වෙන සේ තමාගේ සහ යහළුවාගේ පැන්සල් දෙකේ දිග මැන්නේ ය. දෙදෙනාගේ පැන්සල් වල දිග අතර වෙනස කීය ද?




.....cm

24. රැස්වීමක් අවසන් කරනු ලැබුවේ ප.ව. 2.30 ට ය. එය පැය 4 මිනිත්තු 45 ක් පුරා පවත්වනු ලැබුවේ නම් රැස්වීම ආරම්භ කළ වේලාව කීය ද? .....

25. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

ද්‍රව්‍යය	**මිලට ගත් ප්‍රමාණය**	**1kg ක මිල** **රු. සත**	**වටිනාකම** **රු. සත**
සීනි	2 kg	220 . 50	(1).....
පරිප්පු	500g	350 . 00	(2).....
සහල්	3kg	(3).....	540 . 00
මුළු මුදල			(4).....


26. 

1. රූපයේ අඳුරු නොකළ කොටස භාග සංඛ්‍යාවක් සේ ලියන්න. .....


2. අඳුරු කළ කොටස දශම සංඛ්‍යාවක් සේ ලියන්න. .....

27. ගමනක් ආරම්භයේ දී මෝටර් රථයක තිබූ ඉන්ධන ප්‍රමාණය $24l\ 500ml$ කි. ගමන අවසානයේ ඉතිරිව තිබූ ඉන්ධන ප්‍රමාණය $16l\ \ 450ml$ ක් වේ. ගමන සඳහා වැය වූ ඉන්ධන ප්‍රමාණය කොපමණ ද? .....

28. පාර්සලයක බර මැනීමේ දී පහත දැක්වෙන පඩි සියල්ලම යොදා ගත් අතර තරාදියේ දෙපස ම සමබර වී තිබූ ආකාරය දක්නට ලැබුණි. ඒ අනුව පාර්සලයේ බර ග්‍රෑම් කීය ද? .....



129. එක් දිනකදී එළවළු වෙළඳසැලක විකුණන ලද එළවළු ප්‍රමාණ ප්‍රස්තාරයකින් නිරූපණය කර ඇත.



1. විකුණන ලද ලීක්ස් ප්‍රමාණය කොපමණ ද? .....
2. විකුණන ලද බටු ප්‍රමාණය 35kg නම් එය ප්‍රස්ථාරයේ ඇඳ දක්වන්න.

✷ **ප්‍රශ්න අංක 30 සිට 59 දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

30. සහනශීලී චර්යාවක ලක්ෂණයක් නොවේ.
    1. පුද්ගලයන්ට එරෙහි නොවී අදාළ කරුණු සංයමයෙන් පැවසීම.
    2. ආචාරශීලී වචන හා චර්යා භාවිතය
    3. පුද්ගලයන්ගේ හිතට පහර දෙන ආකාරයට වචන භාවිතය

31. වුවමනාවන් පසුපස වේගයෙන් හඹා යාම නිසා ඇතිවන තත්ත්වය සම්බන්ධ අසත්‍ය ප්‍රකාශයක් වන්නේ,
    1. සිතට සතුට ඇති වීම
    2. දිළිඳු බවට පත්වීම
    3. පවුල් ජීවිතය අසාර්ථක වීම

32. අපගේ ජාතික උරුමයන් ආරක්ෂා කර ගැනීම නිසා රටට සිදුවන යහපතකි.

1. රටේ අනන්‍යතාව ආරක්ෂා වීම
2. සංස්කෘතික වටිනාකම දිනෙන් දින පහළ යාම
3. රට අපකීර්තියකට පත් වීම

33. අපේ රට සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

1. අපේ රට බහු සංස්කෘතික රටකි
2. අපේ රට ලොව ධනවත් ම රටකි
3. අපේ රට බහුජාතික රටකි

34. මේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලාංඡනයයි. ඉන් නිරූපණය කරන පක්ෂියා වන්නේ,



1. සැලළිහිණියෙකි.
2. පරවියෙකි
3. ගිරවෙකි

35. කඩොලාන ශාකවලින් ඇතිවන ප්‍රයෝජනයක් නොවේ,

1. ගෘහ භාණ්ඩ සෑදීමට උදව් වීම
2. සංචාරක පක්ෂින්ට තෝතැන්නක් වීම
3. මුහුදේ රළ පහර නවතා ගැනීමට උදව් වීම


36. පාරිසරික සුන්දරත්වය මෙන් ම මානසික සුවය ලැබීම සඳහා තිබිය යුතු ම දෙයකි.

1. වාහන
2. ගස්වැල්
3. ගොඩනැගිලි

37. ජලාශවල සිටින මසුන් වඳ වී යාමට බලපාන මිනිස් ක්‍රියාකාරකමක් නොවේ,

1. රුවල් නැව් ධාවනය වීම
2. රසායන ද්‍රව්‍ය අඩංගු බෝතල් ජලයට දැමීම
3. මසුන් ඇල්ලීම සඳහා වැරදි ක්‍රම භාවිතය

38. වර්තමානයේ දී වතුර උණු කර ගැනීමට යොදා ගන්නා උපකරණයක් වන්නේ,

1. 
2. 
3. 

39. සුඛෝපභෝගී වෙළඳ සැලකට වඩා සිල්ලර වෙළඳ සැලක මුදල් ගනුදෙනු කිරීමේ දී භාවිත වන්නේ,

1. කාසි හා නෝට්ටු
2. ක්‍රෙඩිට් කාඩ්
3. වීසා කාඩ්

40. තාප විදුලි බලාගාර සඳහා යොදා ගනු ලබන බල ශක්තිය වන්නේ,

1. දහයියා
2. දැව
3. ගල් අඟුරු

41. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පැණි බීම කර්මාන්තය සඳහා අන්තර්ගත සීනි මට්ටම පදනම් කරගෙන වර්ණ කේත පද්ධතියක් හඳුන්වා දී ඇත. මේ සඳහා භාවිත කෙරෙන වර්ණ තුන වන්නේ,

1. රතු, තැඹිලි, කොළ
2. රතු , කහ , කොළ
3. රතු, කහ , නිල්

විෂය අධ්‍යයන කණ්ඩායම - ශ්‍රාවණ්‍ය අංශය

42. විටමින් B බහුල මාෂ බෝග පමණක් අඩංගු පිළිතුර වන්නේ,

1. කඩල, අවර, රටකජු, මිදි
2. කැරට්, පිපිඤ්ඤා,කැකිරි, තම්පලා
3. මුංඇට, උඳු , සෝයා, කඩල

43. ඖෂධ භාවිත කිරීමේ දී සිදුවිය හැකි අනතුරුවලින් වැළකීමට ගතයුතු අත්‍යවශ්‍ය ම පියවර වන්නේ,

1. ආහාර ගැනීමෙන් පසු ඖෂධ භාවිතය
2. නියමිත මාත්‍රාව පිළිපැදීම
3. විශේෂඥ වෛද්‍යවරුන්ගෙන්ම ඖෂධ ගැනීම

44. අක්මා ප්‍රදාහය ලෙස හඳුන්වන්නේ,

1. අතීසාරය 2. කොලරාව 3. කහ උණ

45. දණ්ඩ චුම්බකයක් නිදහසේ එල්ලූ විට සිදුවන්නේ කුමක් ද?

1. S අග්‍රය උතුරු දිශාවට හැරේ
2. N අග්‍රය උතුරු දිශාවට හැරේ
3. N අග්‍රය දකුණු දිශාවට හැරේ

46. වනාන්තරයක ඇවිදීමේ දී යා යුතු දිශාව සොයා ගැනීමට උපකාරී වන්නකි.

1. දුරේක්ෂය 2. අත්කාචය 3. මාලිමාව

47. ''අද්දර තැළීම'' යනු,

1. හේනේ වගාවෙන් පිටත කැලේ කොටස කැපීම
2. අලුතින් ම ගිනි තබා හේනක් ආරම්භ කිරීම
3. පරණ රබර් සෙරෙප්පු පුච්චා මුල්වල තැවරීම

48. අතීතයේ දී බෝග ආරක්ෂා කිරීමට යොදාගත් සාම්ප්‍රදායික ක්‍රම ශිල්පයක් නොවේ,

1. කොහොඹ ඇට නිස්සාරණය
2. අළු යෙදීම
3. කෘමිනාශක ඉසීම

49. කඳු ප්‍රදේශයක දී රියදුරන් විසින් පිළිපැදිය යුතු මාර්ග නීතියක් වන්නේ,

1. කඳු පල්ලම දෙසට ධාවනය වන වාහනවලට ඉඩ දී රිය ධාවනය කිරීම
2. කඳු පාමුල වාහනය නවතාගෙන සිටීම
3. කන්ද දෙසට ධාවනය වන වාහනවලට ඉඩ දී රිය ධාවනය කිරීම

50. ලංකාව තුළ රියදුරන් වාහන ධාවනය කළ යුත්තේ මහා මාර්ගයේ කුමන දෙසින් ද?

1. වමෙන් 2. දකුණෙන් 3. මැදින්

51. පදිකයන් මාරුවන ස්ථානයක මෙම රූපය රත් පැහැයෙන් දිස් වූ විට එහි අදහස වන්නේ,



1. පාර මාරුවන්න
2. පාර හරහා මාරුවීම නොකළ යුතුය
3. වාහන නතර නොකරන්න

ප්‍රාථමික අංශය - ඉගෙනුම් කළාපය

52. ආහාර අරපිරිමැස්මකින් තොරව භාවිත වන අවස්ථාවකි.

1. අතිරික්ත ආහාර සුදුසු පරිදි ගබඩා කිරීම
2. ළමා නිවාසයකට ආහාර වේලක් ලබා දීම.
3. ආහාර ගැනීමේ දී අවශ්‍ය ප්‍රමාණයට වඩා බෙදා ගැනීම

53. කැලණි ගඟ සහ වලවේ ගඟ මුහුදට වැටෙන පළාත් අනුපිළිවෙළින් දැක්වෙන්නේ,

1. බස්නාහිර, දකුණ
2. බස්නාහිර, වයඹ
3. කොළඹ, අම්බලන්තොට

54. ඩෙංගු උවදුර මර්දනය සඳහා අප විසින් කළ යුතු වන්නේ,

1. මදුරුතලා පිළිස්සීම
2. හවස් වනවිට දොර ජනෙල් වසා දැමීම
3. මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීම

55. අකුණු සහිත වර්ෂාවක් පවතින අවස්ථාවක නොකළ යුතු ක්‍රියාවකි.

1. විදුලි උපකරණ හා අකුණුවලින් හානි සිදුවිය හැකි උපකරණ භාවිත නොකිරීම
2. අනතුරකට ලක්විය හැකි ආකාරයේ ස්ථානවල රැඳී සිටීම
3. එළිමහන් පිට්ටනියක ක්‍රීඩා කරමින් නොසිටීම

56. පාසල් යන වයසේ දරුවකු සාමාන්‍යයෙන් දිනකට පානය කළ යුතු ජල ප්‍රමාණය,

1. ලීටර 1½ - 2 අතර
2. ලීටර 6 -8 අතර
3. ලීටර 5 - 7 අතර

57. විටමින් C ඌනතාවය නිසා හටගන්නා රෝගාබාධ වන්නේ,


1. ශරීරයේ වර්ධනය හීනවීම
2. ඇස් පෙනීම දුර්වල වීම
3. මුඛය ආශ්‍රිත රෝග ඇතිවීම

58. පරිසර හිතකාමී තිරසර සංවර්ධනයට දායකවීමේ අභිලාෂයෙන් පාසල් ගෙවත්ත සඳහා හඳුන්වාදී ඇති සංකල්පයකි.


1. 3 B
2. 3 R
3. 3 D

59. සාර්ථකව බල්බය දල්වා ගත් අවස්ථාවක් වන්නේ,

1.



2.



3.

